# ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan)

## දෙවන බස සිංහල - 6 ශ්‍රේණිය

(2021 වර්ෂය සඳහා 6 ශ්‍රේණිය ඉගෙනම් සැලැස්ම කාලච්ඡේද 40කින් සමන්විත වේ. 6 ශ්‍රේණිය 1, 2, හා 3 වාරවලට අදාළ ඉගෙනුම් පල සඳහා පෙළ පොතේ පාඩම් තෝරා පහත වගුවේ සඳහන් කර ඇත. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | පෙළ පොතේ පාඩම | කාලච්ඡේද | වාරය |
|---|---|---|---|---|---|---|
| 4.0 | 4.1 | • සරල අකුරු ලියයි.<br>• පිල්ලම් සහිත අකුරු ලියයි.<br>• සරල අකුරු හා පිල්ලම් සහිත (අකුරු දෙකේ සහ තුනේ) වචන ලියයි. | • සරල අකුරු හා පිල්ලම් ලිවීම | අකුරු ඉගෙන ගනිමු | 4 | පළමු වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 4.0 | 4.1 | • සරල අකුරු ලියයි.<br>• පිල්ලම් සහිත අකුරු ලියයි.<br>• සරල අකුරු හා පිල්ලම් සහිත (අකුරු දෙකේ සහ තුනේ) වචන ලියයි. | • සරල අකුරු හා පිල්ලම් ලිවීම | පිල්ලම් ඉගෙන ගනිමු | 3 | |
| 2.0<br>4.0 | 2.6, 4.2, | • සරල වාක්‍ය ලිවීමේ හුරුව ලබයි.<br>• සරල වාක්‍ය ලියයි.<br>• තමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සබකෝලයෙන් තොර ව තොරතුරු ඉදිරිපත් කරයි. | • තමා පිළිබඳ විස්තර කිහිපයක් ලිවීම<br>• නිවසේ පරිසරය ඇසුරින් සරල වාක්‍ය ලිවීම. | **01.** මේ මමයි | 3 | |
| 1.0 | 1.2 | • උපදෙස් සහිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපදෙස්වලට ප්‍රතිචාර දක්වයි.<br>• උපදෙස් අනුව කටයුතු කරයි. | • නිවසේ දී ලැබෙන අර්ථවත් උපදෙස් | **02.**පාසල් යමු | 4 | දෙවන වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 1.0<br>3.0 | 1.5, 3.2 | • තාල තබමින් ගීතය රස විඳියි.<br>• සාමූහික ව ගීතය ගායනා කරයි.<br>• ගීතයේ සරල අදහස තේරුම් ගනියි.<br>• තනි තනි ව ගීතය ගායනා කරයි.<br>• ගීතයට අනුව තාල තබයි.<br>• ගීතයට සවන් දෙමින් ගීත ගායනයට හුරු වෙයි.<br>• සාමූහික ව ගීතය ගායනා කරයි.<br>• ගීතය රස විඳියි. | • සරල ළමා ගීතයක ගී පද කියවීම හා ගායනය<br>හා හා හරි හාවා<br>කැළේ මැදින් ආවා...<br>ගීත රචනය - කුමාරතුංග මුනිදාස | **05.** හාවා නැටුම් පැවා | 7 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2.0 | 2.2 | • අවධානයෙන් සවන් දී ප්‍රශ්න කරයි.<br>• නිවැරදි මග පැහැදිලි කරයි.<br>• නිවැරදි ව නිරවුල් ව මග විමසීම්වලට පිළිතුරු ලබා දෙයි. | • **දුරකථනයෙන් මග විමසීම** | **06.** නුවර මාමා එනවා | 4 | |
| 1.0 | 1.3 | • විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br>• තොරතුරු අනුව යමක් සොයා ගනියි.<br>• සවන් දුන් විමසීම් අනුව නිවැරදි ව කටයුතු කරයි. | • **ගෙදර පරිසරයෙන් යමක්/යමෙක් සෙවීම. (පූස් පැටියා නැති වී සෙවීම)** | **08.** පූසා හැංගිලා | 4 | තෙවන වාරයෙන් තෝරා ගත් පාඩම් |
| 2.0 | 2.5 | • ගනුදෙනුවට අදාළ ව ප්‍රශ්න අසයි.<br>• ගනුදෙනුවට අදාළ ව තමන්ගේ අදහස් ප්‍රකාශ කරයි. | • **වෙළඳ සැලකින් පලතුරු මිල දී ගැනීම.** | **09.** අපි පොළට යමු. | 4 | |
| 3.0 | 3.4 | • කතන්දරයක රූප බලා ඒවාට අදාළ වැකි කියවයි.<br>• නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවයි.<br>• එවැනි තවත් සරල ළමා කතන්දර කියවයි. | • **පිපාසිත කපුටා වතුර සොයා ගිය කතන්දරය** | **11.** පිපාසිත කපුටා | 3 | |
| 1.0<br>2.0 | 1.4, 2.1 | • සවන් දුන් නිවේදනයේ ඇතුළත් තොරතුරු කියයි.<br>• සවන් දුන් නිවේදනයට අනුව කටයුතු කරයි.<br>• සරල උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි.<br>• සරල උපදෙස්වලට අනුව ක්‍රියා කරයි. | • **නිවැසියන් දුම්රියෙන් ගමනක් යාම.**<br>• **ගෙදර පොදු කටයුතුවල දී ලැබෙන උපදෙස්** | **12.** දුම්රියෙන් ගමනක් | 4 | |